**නාවික හා ගුවන් සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්ගලික) සමාගම - 2016/2017**

---

නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්ගලික) සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

---

සමාගම 2012 වර්ෂයේ සිට අඛණ්ඩව අලාභ ලබා තිබීම, ආයතනය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත්වීම, ආයතනය නිශ්ක්‍රීයව පැවැත්වීම හා ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබානොදීම යන කරුණු දක්වමින් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයක් සලකා බලමින් 2016 අගෝස්තු 23 දින සමාගම ඇවර කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කිරීමත් සමග සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වී තිබුණි. ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් 2.2 මගින් හෙළිදරව් කර තිබුණි.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 මාර්තු 31 දිනට නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 10 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන කට්ටලයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් ඇතුළත් විය යුතු වුවත් සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන සමග මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු වටිනාකම රු.26,000,000ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.25,852,754 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම රු.147,246 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 2.2.3 පැහැදිළි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් ආයෝජන හා තැන්පතු ගිණුමේ සහ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂයන් හා ඊට අදාළ උප ලේඛණ සමග සැසඳීමේදී එකතුව රු.312,000 ක වෙනස්කම් පැවතුණි.

### 2.3 ලැබිය යුතු ගිණුම්

වසර 04 කට අධික කාලයක සිට අයවිය යුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණු රු.930,355 ක් වූ රඳවා ගැනීම් බදු ශේෂය සමාලෝචිත වර්ෂයේදී ලියාහැර තිබූ නමුත් ඒ සඳහා වූ විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත්කර තිබුණේ 2017 සැප්තැම්බර් 14 දිනදීය. කෙසේ නමුත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2017 නොවැම්බර් 15 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2007 අංක 07 දරන සමාගම් පනතේ XII වන කොටස | 2016 අගෝස්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි සමාගම ඈවර කිරීමට කටයුතු කළ බවත්, ඈවර කිරීමේ කටයුතු අවසන් අදියරේ පැවතෙන බවත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දීම හැරුණු කොට පහත සඳහන් අවශ්‍යතා ඉටු කර නොතිබුණි. |
| (I) සමාගම් පනතේ 319(1) (අ) වගන්තිය | ස්වෙච්ඡාවෙන් ගණන් බේරා වසා දැමිය යුතු බවට විශේෂ යෝජනා සම්මතයන් සිදුකිරීම. |
| (II) සමාගම් පනතේ 330 (1) වගන්තිය | අදාල විශේෂ යෝජනා සම්මතය ගැසට් පත්‍රයේ පළකර දැනුම් දීම. |
| (III) සමාගම් පනතේ 346(1) වගන්තිය | ඈවරකරුගේ පත්වීම පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළකරමින් ලියාපදිංචිය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීම. |
| (IV) සමාගම් පනතේ 330(1) හා 331 වගන්තිය | මහා සභා රැස්වීම් කැඳවීම, අවසාන රැස්වීම කැඳවීම, ගණන් බේරා වසා දැමීම පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කිරීම් හා (3) (1) උප වගන්තිය අනුව සතියක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දීම. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමේ සමාලෝචිත වර්ෂයේ අලාභය රු. 505,475 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු. 1,439,557 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.934,082 කින් හෙවත් සියයට 65 කින් අඩු වී තිබුණි. සමාගමේ මෙහෙයුම් කටයුතු නොමැතිවීම නිසා ආයතන හා පරිපාලන වියදම් අඩුවීම ඉහත අලාභය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012/2013 ගිණුම් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සමාගම අඛණ්ඩව අලාභ ලබා තිබුණි. 2016 අගෝස්තු මාසයේදී සමාගම ඈවරකිරීමට තීරණය කිරීම හේතුවෙන් සේවක පාරිශ්‍රමික හැර අනිකුත් පරිපාලන වියදම් සීමාවී පැවති

බැවින් 2015/2016 වර්ෂයේදී ඍණ අගයක්ව පැවති දායකත්වය 2016/2017 ගිණුම් වර්ෂයේදී රු. 1,055,951 ක් දක්වා වැඩිවී තිබූ බව නිරීක්ෂණය විය.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අලාභය රු.මිලියන 6.68 ක් වූ අතර එය ප්‍රකාශිත ප්‍රාග්ධනය වූ රු.මිලියන 30 ට ගැලපූ පසු රු.මිලියන 23.32 ක් දක්වා සියයට 22 කින් ප්‍රාග්ධන බාදනයක් සිදුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සාගර හා ගුවන් පරිවහනය පිළිබඳ තොරතුරු හා ආනයන හා අපනයන කටයුතු පිළිබඳ තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කිරීම, පර්යේෂණ සිදුකිරීම, ඒ ආශ්‍රිත ව්‍යාපාර ප්‍රවර්ධනය හා උපදේශාත්මක සේවා සැපයීම ආදිය සමාගමේ ප්‍රධාන අරමුණු ලෙස දක්වා තිබුණි. එහෙත් සමාගම විසින් පූර්වෝක්ත අරමුණු ඉටු කිරීමට අදාළ වූ කිසිදු මෙහෙයුම් කාර්යයක් වර්ෂ ගණනාවකින් සිදුකර නොතිබුණි.

(ආ) සමාගම 2014 වර්ෂයෙන් පසු කිසිදු මෙහෙයුම් කාර්යයක් සිදුකර නොතිබුණු අතර නිශ්චිත ඉදිරි සැලසුමක්ද රහිතව අක්‍රීයව පැවතුණි. 2015 ඔක්තෝබර් 15 දින නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර ඇතත් එම අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචිත වර්ෂය තුළ එක් වරක්වත් රැස්වූ බවට වාර්තාගතව නොතිබුණි. කෙසේ වෙතත්, සමාගමේ නිෂ්කාර්ය කාර්ය මණ්ඩල සාමාජිකයන් 04 දෙනෙකු වෙනුවෙන් වැටුප් සහ දීමනා ගෙවීම සඳහා වර්ෂය තුළ රු. 1,549,949 ක වියදමක් දරා තිබුණි. සමාගම වැටුප් ගෙවීම ඇතුළු ආයතන හා පරිපාලන වියදම් දැරීම සඳහා බැංකු අයිරාවක්ද උපයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවති බැංකු අයිරාව රු.2,371,079 ක් වී තිබුණි. ඒ අනුව සමාගම නිශ්කාර්ය වියදම් දැරීම හැරුණු විට කිසිදු කාර්ය සාධනයක් ලබා නොතිබුණි.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

නිශ්චිත කාර්යභාරයක් රහිතව අතිරික්ත කාර්ය මණ්ඩලයක් සිටියදී සමාගම විසින් 2016 මාර්තු 03 දින කළමනාකරණ සහකාර සේවයට කොන්ත්‍රාත් පදනම මත නව නිළධාරිනියක් බඳවාගෙන 2017 මාර්තු 31 දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 422,066 ක් ගෙවා තිබුණි. අක්‍රීයව පැවති ආයතනය තුළ මෙම නිළධාරිනියට පැවරුණු රාජකාරිය හෝ ඇය ඉටුකළ කාර්යභාරය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවූ අතර තවදුරටත් නව පත්කිරීම් සිදු කිරීමේ අවශ්‍යතාව කුමක්ද යන්න විගණනයේදී ගැටළු සහගත විය.